ණය මුදල් නියමිත දිනට නොගෙවීම මත අමතර පොලියක් (Penal Interest) අය කිරීම.

- ඔබ විසින් නියමිත වාරික දිනට ණය වාරිකය ගෙවනු ලබන්නේ නම් බැංකුව විසින් කිසිදු අමතර පොලියක් (Penal Interest) අය කරනු නොලැබේ.
- නමුත් ඔබ විසින් නියමිත දිනට ණය වාරිකය හෝ ණය වාරිකයේ කොටසක් නොගෙවා සිටී නම් එම හිඟ වාරික මුදල් සඳහා ණය වාරිකය ගෙවීය යුතු දින සිට හිඟ මුදල ගෙවන දින දක්වා වාර්ෂිකව 2% ක අමතර පොලී අනුපාතයක් (Penal Interest) බැංකුව විසින් අය කරනු ලැබේ.
- ණය මුදල් නියමිත දිනට නොගෙවීම මත අය කරනු ලබන අමතර (Penal Interest) පොලී මුදල පහත පරිදි ගණනය කරනු ලැබේ.

$$\text{අමතර (Penal Interest) පොලී මුදල} = \text{ගෙවීමට ඇති හිඟ වාරික වටිනාකම} \times \frac{\text{ණය වාරිකය ගෙවිය යුතු දින සිට ගෙවන දින දක්වා දින ගණන}}{365} \times 2\%$$

- බැංකුවේ ක්‍රියාත්මක වන සියලුම ණය කාණ්ඩ සඳහා ණය මුදල් නියමිත දිනට නොගෙවීම මත අය කරනු ලබන අමතර (Penal Interest) පොලී ගණනය වීම අදාල වේ.